ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
இலங்கை பத்திரிகை முறைப்பாட்டு ஆணைக்குழு
Press Complaints Commission of Sri Lanka

e-Newsletter
Vol 02: May - August 2010

Website: www.pccsl.lk
E-mail: pccsl@pccsl.lk
Tel: +94 115 353635
Fax: +94 115 335500

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ 2009 වාර්ෂික වාර්තාව නිකුත් වෙයි




ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ 2009 වසරේ වාර්ෂික වාර්තාව පසුගියදා නිකුත් කෙරිණ. පසුගිය අගෝස්තු 10 ද පැවති වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු එම හයවන වාර්ෂික වාර්තාව එළි දැක්විණි.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්යය පටිපාටියට බැහැරව පසුගිය 2009 වසරේ දී විසඳුණු පැමිණිලි ප්‍රමාණය කැපීපෙනෙන තත්ත්වයක පවතී. එහිදී පැමිණිලිකරුවන් සෘජුවම පුවත්පතේ කර්තෘවරයා වෙත යොමු කළ පැමිණිලි සඳහා කර්තෘවරයාගේ අනුකූලතාව අනුව පිළිතුරු දීමේ අයිතියට ඉඩ සලසා දී ඇත.

පසුගිය 2009 වසරේ දී ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ක්‍රියා පටිපාටියට බැහැරව විසඳුණු මුළු පැමිණිලි ගණන 363 කි. එහිදී පැමිණිලිකරුවන් සෘජුවම පුවත්පතේ කර්තෘවරයා සමඟ ගනුදෙනු කළේ ය. මේ අතරින් පැමිණිලි 270 ක් සිංහල මුද්‍රිත මාධ්‍යය සම්බන්ධව වූ අතර දෙමළ මුද්‍රිත මාධ්‍යය සම්බන්ධ පැමිණිලි 12 ක් ද ඉංග්‍රීසි මුද්‍රිත මාධ්‍යය සම්බන්ධව පැමිණිලි 81 ක් ද විය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපති කුමාර් නඩේසන් මහතා වාර්ෂික වාර්තාවට ලබා දී ඇති සිය පණිවිඩයේ මෙසේ සඳහන් ව ඇත. ''ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම දැනටමත් ප්‍රකාශකයන් ගේ, කර්තෘවරුන් ගේ සහ ජනමාධ්‍යවේදීන් ගේ පිළිගැනීමට ලක්ව ඇති අතර ඔවුන් සියලු දෙනාම එහි ඉල්ලීම්වලට නොපමාව එකඟ වේ. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ලබාදෙන විනිශ්චයන් වර්තමාන පුවත්පත්වල පළකරන ලද ප්‍රමාණයේ ක්‍රමවත් වර්ධනයක් තිබේ. මෙම විනිශ්චයන් හැරුණුකොට පීඩාවට පත්වුණු පාඨකයන් ගේ ''පිළිතුරු දීමේ අයිතිය" පිළිගෙන පුවත්පත් කතුවරුන් විසින් ස්වේච්ඡාවෙන්ම කරනු ලබන පළ කිරීම් ප්‍රමාණය වර්ධනය වී ඇත. මීට අමතරව ක්ෂේත්‍රයේ සිටින ජනමාධ්‍යවේදීන් හා අලුතින් එක්වන්නන් කර්තෘ සංසද වෘත්තීය ප්‍රතිපත්ති මාලාවට දායක වෙමින් සිටිති.

මේ වසරේ කැපීපෙනෙන ලක්ෂණය වන්නේ කතුවරුන් වෙත සෘජුවම ලැබුණු පැමිණිලි විසඳගැනීම සඳහා දක්වන ලද විශිෂ්ට අනුකූලතාව බව ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපති සැම් විජේසිංහ මහතා වාර්ෂික වාර්තාවට ලබා දි ඇති පණිවිඩයේ සඳහන් වෙයි.

"පිළිතුරු දීමේ අයිතිය" යන ආකෘතිය පවත්වාගෙන යාමට ජනමාධ්‍ය වැඩි අවධානයක් යොමු කිරීම සමාජ වගකීමෙන් යුත් ජනමාධ්‍යයක් ගොඩනැගීමේ දී පුවත්පත් අංශයෙන් සිදු වූ වර්ධනයක් බව ද හෙතෙම එම පණිවිඩයෙන් පෙන්වා දෙයි.

# ලෝකයේ නොයෙක් රටවල පවතින ජනමාධ්‍ය ආරවුල් නිරාකරණ මණ්ඩල පිළිබඳ සටහන්

ලෝකයේ නොයෙක් රටවල ක්‍රියාත්මක වන ජනමාධ්‍ය ආරවුල් නිරාකරණ මණ්ඩල සමන්විතව ඇති ආකාරය පිළිබඳ ව ඔබගේ අවධානය යොමු කිරීම මෙම සටහනේ අරමුණ වේ. ඒ අතරින් ඕස්ට්‍රේලියාව, බෙල්ජියම සහ පින්ලන්තය යන රටවල් හි පවත්නා එවන් ආයතන කෙරෙහි මෙවර කලාපයෙන් අපි ඔබගේ අවධානය යොමු කරන්නෙමු.

## ඕස්ට්‍රේලියාව

ඕස්ට්‍රේලියානු පුවත්පත් මණ්ඩලය සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත වෙයි. එය පුවත්පත් ප්‍රකාශකයන්, ජනමාධ්‍ය සංගම් නියෝජිතයන්, ස්වාධීන මාධ්‍යවේදීන් ගෙන් සහ මහජන සාමාජිකයන්ගෙන් යුක්ත ය. එහි සභාපතිවරයා ස්වාධීන සාමාජිකයකු වෙයි. එම ආයතනය පුවත්පත් සහ වාර ප්‍රකාශන කර්මාන්තයේ මූල්‍යාධාර ලබයි.

## බෙල්ජියම

බෙල්ජියම සාමාජිකයන් 18 දෙනකුගෙන් යුත් මණ්ඩලයකින් සමන්විත ය. එම මණ්ඩලය ජනමාධ්‍යවේදීන් හය දෙනකු ගෙන් පුවත් ප්‍රකාශකයන් සහ මාධ්‍ය ආයතන නියෝජිතයන් හය දෙනකු ගෙන්, සිවිල් සමාජ සාමාජිකයන් හය දෙනකු ගෙන් (විනිසුරුවරුන්, මහාචාර්යවරුන්, සහ බහුජන සංවිධාන සාමාජිකයන් ) එම ආයතනය ජනමාධ්‍ය ආයතන සහ ජනමාධ්‍ය සංගම්වලින් 50 ට 50 පදනම මත මූල්‍යාධාර ලබයි. සංගම් මේ සඳහා බෙල්ජියම් රජයෙන් සහනාධාර ලබයි.

## ෆින්ලන්තය

ජනමාධ්‍යයට අදාළ පසුබිමක් සහිත සභාපතිවරයකු ගෙන් සමන්විත ෆින්ලන්ත මණ්ඩලය සාමාජිකයන් 11 දෙනකු ගෙන් සමන්විත ය. ජනමාධ්‍ය විශේෂඥයන් හත් දෙනකු සහ මාධ්‍ය ආයතනයක රැකියා කරන හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් නොවන මහජන සාමාජිකයන් තිදෙනකු ගෙන් සමන්විත ය. එම ආයතනය, මාධ්‍ය ආයතන කළමනාකරණය කරනු ලබන සමූහ ව්‍යාපාරයන් ගෙන් 3/2 ක දායකත්වයක් සහ අධිකරණ අමාත්‍යාංශයේ 3/1 දායකත්වයක් වශයෙන් මූල්‍යාධාර ලබයි.

## ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වාර්ෂික මහ සභා රැස්වීමේ අවස්ථා කිහිපයක්

2010 අගෝස්තු 10





වාර්ෂික මහ සභා රැස්වීමට සහභාගි වූ සාමාජිකයන් ගෙන් පිරිසක්.



ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ සභාපති කුමාර් නඩේසන් මහතා අදහස් දක්වන අයුරු.

## ආරවුල් නිරාකරණ මණ්ඩලය

ආරවුල් නිරාකරණ මණ්ඩලය මාස දෙකකට වරක් රැස්වෙයි. එම මණ්ඩලය පසුගිය ජූනි සහ අගෝස්තු මාස වලදී රැස්විය. සමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත ආරවුල් නිරාකරණ මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ කලක් පාර්ලිමේන්තුවේ මහ ලේකම් වරයා වශයෙන් මෙන්ම දුක්ගන්නාරාල (ඔම්බුඩ්ස්මන්වරයා) වශයෙන් කටයුතු කළ සෑම් විජේසිංහ මහතාය. ආරවුල් නිරාකරණ මණ්ඩලය, සිවිල් සමාජ නියෝජිතයන් හය දෙනෙකුගෙන් සහ පුවත්පත් කර්මාන්තයේ නියෝජිතයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. එම මණ්ඩලයේ නියෝජිතයන් වශයෙන් ආචාර්ය දෙවනේසන් නේසය්යා, සිත්ති තිරුචෙල්වම්, ජාවේඩ් යුසුෆ්, ලුසිල් විජේවර්ධන, සිරි රණසිංහ, විජිතා ප්‍රනාන්දු, ප්‍රමෝද් ද සිල්වා, ඩයන් ස්කුමන්, දයා ලංකාපුර, ටී සභාරත්නම් යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

## ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සහ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයක්.

දෙවන කොටස

| අරමුණු | ව්‍යවස්ථාපිත ආයතන පාර්ලිමේන්තු පනත ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මාධ්‍ය (කර්මාන්තයේ) ව්‍යාපාරයේ සහයෝගය ලබන ස්වයං නියාමන යාන්ත්‍රණය |
|---|---|---|
| ■ බලතල | ■ අධිකරණ බලතල ඇත.<br><br>■ දිස්ත්‍රික් උසාවියක් සතු පහත බලතල ද ඇත. (සාක්ෂිකරුවන්, ලේඛකයන් කැඳවීම, වරදකරුවන්ට දඩ මුදල් නියම කිරීම සහ වරදකරුවන් බන්ධනාගාරගත කිරීම)<br><br>■ විමර්ශන ආරම්භ කිරීමට සහ මාධ්‍යයට දඬුවම් කිරීමට බලතල භාවිතා කළ හැකි ය. | ■ පැමිණිලි විසඳීමේ දී සමථකරණ (Conciliation), මැදිහත්කරණ (Mediation) සහ බේරුම්කරණ (Arbitration) ක්‍රියාවලිය යොදා ගනී.<br><br>■ කතුවරයා සහ පැමිණිලිකරු යන දෙදෙනාම සෑහීමට පත්වන පරිදි පැමිණිලි විසඳීම. |
| ■ වගකීම් | ■ පුවත්පත්/ සඟරා ලියාපදිංචිය<br><br>■ පැමිණිලි භාරගැනීම සහ විසඳීම, 2002 වසර දක්වා සිදුවිය. | ■ පැමිණිලි භාර ගැනීම සහ විසඳීම, 2003 ඔක්තෝබර් මාසයෙන් පසු,<br><br>■ වෘත්තීය ආචාර ධර්ම මාලාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම.<br><br>■ කොළඹ සහ ප්‍රාදේශිය වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම මඟින් මාධ්‍යවේදීන් අතර ආචාර ධාර්මික වාර්තාකරණය ප්‍රවර්ධනය කිරීම සහ සිවිල් සමාජය දැනුම්වත් කිරීම. |
| ■ ජනමාධ්‍යයේ වෘත්තීය තත්ත්වය | ■ මාධ්‍යවේදීන් බොහෝ දුරට නොදන්නා නමුත් නීතිය මඟින් ගැසට් කරන ලද ආචාර ධර්ම මාලාවක් ඇත. | ■ ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් සම්පාදනය කරන ලද, 2008 වසරේ දී සංශෝධිත වෘත්තීය ආචාර ධර්ම මාලාව (වෘත්තීය ප්‍රතිපත්ති මාලාව) පවතී.<br><br>■ මෙම ආචාර ධර්ම මාලාව සියලු මාධ්‍ය සංවිධාන මගින් පිළිගෙන අනුගමනය කරනු ලබයි. |

ඉතිරි කොටස මීළඟ කලාපයෙන්

## බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමෙන්

### ‘ඩේලි ස්ටාර්’ පුවත්පතට එරෙහි පැමිණිල්ල පුවත්පත් පැමිණිලි කොමිසම පිළිගනී.

''මුස්ලිම්වරුන් පමණක් සඳහා වූ පොදු වැසිකිළි'' මැයෙන් ‘ඩේලි ස්ටාර්’ පුවත්පතෙහි පළ වූ ලිපිය සම්බන්ධව එම පුවත්පතට විරුද්ධව ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පුවත්පත් පැමිණිලි කොමිසම විසින් පිළිගන්නා ලදි. එසේ පිළිගන්නා ලද්දේ එම ලිපිය සාවද්‍ය හා නොමග යවනසුලු තොරතුරු ඉදිරිපත් කරමින් බ්‍රිතාන්‍ය පුවත්පත් කතුවරුන්ගේ ප්‍රතිපත්ති මාලාවේ පළවෙනි වගන්තිය (නිරවද්‍යතාව) උල්ලංඝණය කරන බව පවසමිනි.

මුල් පිටුවෙහි පළවූ මෙම පුවතින් වාර්තා වූයේ රොච්ඩේල් සාප්පු මධ්‍යස්ථානයේ ''මුස්ලිම්වරුන් පමණක් සඳහා පොදු වැසිකිළි'' ඉදිකර ඇති බවත් ප්‍රාදේශීය සභාව මේ සඳහා ‘ඔබගේ මුදල්'' අපතේ යවා ඇති බවත්ය. පැමිණිලිකරු කියා සිටියේ මෙම පහසුකම් සියලුදෙනාගේම ප්‍රයෝජනය සඳහා ඇති බැවින් එය ''මුස්ලිම්වරුන් සඳහා පමණක්'' යන්න පැවසීම සාවද්‍ය බවත් එමෙන්ම මෙම සාප්පු සංකීර්ණය මෙම වැසිකිළි සඳහා මුදල් වැය කිරීමට තීරණය කර ඇති බැවින් මේ සඳහා බදු ගෙවන්නන්ගෙන් මුදල් යෙදවීමක් සිදු නොවන බවය. කෙසේ වෙතත් මෙම වැසිකිළි නිර්මාණය කර ඇත්තේ මුස්ලිම් ජාතිකයන් සිතෙහි තබාගෙන බව පුවත්පත පවසා සිටියත් ඔවුන්ගේ ශීර්ෂපාඨ දෙක වැරදි සහිත බවත් වැසිකිළිවලට මුදල් යොදවන්නේ ප්‍රාදේශීය සභාවෙන් නොව පෞද්ගලික ව්‍යාපාරිකයකු බවත් මෙම පුවත්පත පිළිගෙන ඇත. එම පුවතේ මුල් පිටපත වෙබ් අඩවියෙන් ඉවත්කරගෙන ඇති අතර දෙවන පිටුවෙහි නිවැරදි කිරීමක් පළ කර ඇත.

පුවත්පත් පැමිණිලි කොමිසම පැහැදිලි කළේ මෙම තීරණයට එළඹීමේදී විශේෂයෙන් අවධානය යොමු කරන ලද්දේ පුවත්පත් වාර්තාව ඉදිරිපත් කිරීමේදී දක්වා ඇති නොසැලකිලිමත් භාවය කෙරෙහි බවයි. වෙනස් අරුතක් ඇති කරන ලෙස පාඨකයන් නොමග යන ආකාරයෙන් වාර්තා කර තිබීම එම වාර්තාවේ පැහැදිලිවම දක්නට ලැබෙන වැරදි දෙක බව බ්‍රිතාන්‍ය පුවත්පත් පැමිණිලි කොමිසමේ නිගමනය වේ.

# ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ කාර්යභාරය පිළිබඳ ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම සිවිල් සමාජය සහ මාධ්‍යවේදීන් දැනුම්වත් කරයි.

## දැනුම්වත් කිරීමේ වැඩසටහන්හි අවස්ථා කිහිපයක් - 2010



ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු, කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රදර්ශනය කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී, කමල් ලියනආරච්චි මහතා විසින් පුස්තකාලයාධිපති කේ. එම්. සිරිසේන මහතාට භාර දෙන අවස්ථාව. ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ දෙමළ පැමිණිලි නිලධාරී අමීන් හුසේන් මහතා ද පසෙකින් සිටියි. (2010 ජූනි 17)



කෝට්ටේ, මාදිවෙල රාහුල මධ්‍ය මහා විධ්‍යාලයේ පැවති 'සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය' සම්මන්ත්‍රණයේ දී ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ ප්‍රාර්ථනා වීරසිංහ මෙනවිය අදහස් දක්වන අයුරු. (2010 ජූලි 15)



ඇල්පිටිය ආනන්ද මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවති ඇල්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සහ විදුහල්පත්වරුන්ගේ හමුව. (2010 මැයි 04)



කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති කොළඹ දිස්ත්‍රික් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ දිස්ත්‍රික් සහකාර ලේකම්වරුන්ගේ හමුව. (2010 ජූනි 11)



ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයේ දී පැවති විශේෂාංග රචනය මැයෙන් වූ ජනමාධ්‍යවේදීන් සඳහා වූ පුහුණු වැඩමුළුවේදී විශේෂාංග කර්තෘවරුන්ගේ සහ විශේෂාංග ලේඛකයින්ගේ හමුව. (2010 අගෝස්තු 13)

## අධ්‍යක්ෂ මණ්ඩලය

**ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ වත්මන් සභාපතිවරයා වන්නේ සිවකුමාර් නඩේසන් මහතාය. නිමල් වෙල්ගම මහතා, සිංහ රත්නතුංග මහතා, මනික් ද සිල්වා මහතා, එන්. එම්. අමීන් මහතා, සුන්දර නිහතමානි ද මැල් මහතා, නිස්තාර් කාසිම් මහතා, සුනිල් ජයසේකර මහතා යනාදීහු අනෙකුත් අධ්‍යක්ෂවරු වශයෙන් කටයුතු කරති.**


පිටු සැකසුම : හසිනි අල්විස් - ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය
ඡායාරූප : මනෝජ් රත්නායක - ශ්‍රී ලංකා ජනමාධ්‍ය විද්‍යාලයය